පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

සතිය- 2021 -05-31- 2021-06-04

විෂය - නර්තනය

ශ්‍රේණිය 13

Prepared by-H.I.NeelaKanthi.

Department of Education,Sabaragamuwa Province/ Weekly School

නිපුණතාව-08 - නර්තන කලාව හා අනෙකුත් සෞන්දර්ය කලාවන් අතර ඇති සහ සම්බන්ධතාව අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.

නිපුණතා මට්ටම 8. 1 නර්තන කලාව හා සබැඳි අනුශාංගික අංග පිළිබඳ තොරතුරු විමසුමට ලක් කරයි.

**නිවැරිදි පිළිතුර තෝරන්න.**

1.දේශීය ශාන්තිකර්ම අතරින් රංග සැරසිලි වැඩි ප්‍රමාණයක් දක ගත හැකි සම්ප්‍රදාය වනනේ

1. උඩරට සම්ප්‍රදාය 2. පහතරට සම්ප්‍රදාය 3. සබරගමු සම්ප්‍රදාය 4 සම්ප්‍රදායන් තුනෙහිම

2.පහතරට ශාන්තිකර්ම අතරින් රංග භාණ්ඩ ඉතා විශාල සංඛ්‍යාවක් දැකිය හැකි වන්නේ

1. දෙවොල්මඩුව ශාන්තිකර්මය 2.පහන්මඩුව ශාන්තිකර්මය 3. රටයකුම ශාන්තිකර්මය 4. සූනියම්යාගය ශාන්තිකර්මය

3.කොහොඹා කංකාරි ශාන්තිකර්මයට අයත් නොවන සැරසිල්ලකි

1.මුවය සහිත කෙසෙල් ගස 2.අයිලය 3.මඩුසැරසිලි 4.පත්තින තොරණ

4.පත්තිරුප්පුව යන රංග සැරසිල්ල අයත් වන නර්තන සම්ප්‍රදාය වන්නේ

1. උඩරට සම්ප්‍රදාය 2. පහතරට සම්ප්‍රදාය 3. සබරගමු සම්ප්‍රදාය 4 සම්ප්‍රදායන් තුනෙහිම

5. රංග සැරසිලි සහිත රංගභූමිය වැඩි වශයෙන් ප්‍රයෝජනයට ගනු ලබන්නේ

1.ගායනා අවස්ථා වලදිය 2. වාදන අවස්ථා වලදීය 3.නර්තන අවස්ථා වලදිය 4. නාට්‍යමය අවස්ථා වලදීය

**හිස්තැන් සදහා කෙටි පිළිතුරු යොදන්න.**

6.ශාන්තිකර්ම භූමිය හදුන්වන තවත් නම් කීපයකි .----------------- ------------------

7.-------------- ශාන්තිකර්මයේදී ගිණිකඳු හතක් සංකේතවත් වන ආකාරයට පත්තිනි තොරණ නිර්මාණය කරයි.

8.යක් තොවිල් වලදී තුණුරුවන් හා දෙවියන් විෂයෙහි අත්‍යාවශ්‍ය පූජා ද්‍රව්‍ය තැබීම සදහා ---------- ඉදි කෙරේ.

9.සිටුවා කනු --- එකතු කර - අටවා මේ ලෙස සැදි ලැලි සිරකර යන කවිය ---------- සැරසිලි කවි වලට අයත්ය.

10.සන්නියකුම් යාගයේදී රංග මණ්ඩපය හදුන්වන තවත් නම් දෙකකි.---------------- --------------------

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

11.ශාන්තිකර්ම භූමියේ දිග පළල දැක්වෙන කාව්‍ය සාහිත්‍යයේ එන කවියක් ලියන්න.

12.ශාන්තිකර්ම වල භාවිත පසුතලයන් සම්ප්‍රදායන් අනුව වෙන වෙනම ලියන්න.

13.ශාන්තිකර්ම භූමියේ පසුතල සැකසුම් සදහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය මොනවාද ?

14.ශාන්තිකර්මයෙහි අන්තර්ගතය මතුකර දක් වීමට පසුතල සැලසුම්කරණය දායක වන ආකාරය විස්තර කරන්න.